# සජ්ඣායනා

## (මුහුකුරා ගිය යෞවනයෙන් - හිරිමල් යෞවනයට ඔවදනක්)



ඡායාරූප - දීපිකා කුමාරි

'සජ්ඣායනා' යන නම ඇසෙන විට බෞද්ධයන් වන අපට එක් වරම සිහිපත් වන්නේ පිරිත් සජ්ඣායනාවයි. එසේ වුවද මෙම පදය ඒ හා සමාන වූ විවිධ අරුත් දනවන්නකි. සිංහල - ඉංග්‍රීසි ශබ්දකෝෂවල මෙය 'රිහර්සල්' යන ඉංග්‍රීසි වචනයෙන් අරුත් දැක්වෙයි. එනම්, යම් කිසිවක් නිතර නිතර කියමින් කරනු ලබන පුහුණු වීමකි. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයට අනුව මෙහි අරුත වන්නේ 'කීම', නැතහොත් 'හැදෑරීම' යන්නයි. අප අතර බෙහෙවින් මෙම වචනය භාවිත වන්නේ පිරිත් දේශනාවක් සම්බන්ධයෙනි. මෙවන් අරුත් දැනවෙන පදයක් තම කුලුඳුල් නවකතාවට යොදා ගන්නා නවතම ලේඛිකාවක් වන සමන්තා විජේසිංහ මහත්මිය එමගින් සමාජයට දෙන පණිවුඩය සැබවින්ම නූතන යෞවන යෞවනියන්ට මෙන්ම ඔවුන්ට මග පෙන්වීමට සිටින වැඩිහිටියන්ට ද වැඩදායකය.

සාහිත්‍යයේ මූලික පරමාර්ථය කියවන්නා තුළ රසයක් දැනවීම බවට විශ්වනාථ එදා කළ ප්‍රකාශය කාලයාගේ ඇවෑමෙන් තවතවත් අරුත් එක් වීමෙන් පුළුල් බවට පත් වී ඇත. රස ජනනය නොවන කෘතියක් සාහිත්‍යය ලෙස හැඳින්වීම එදා මෙන්ම අද ද කිසි සේත් සිදු නොවූවකි, සිදු නොවන්නකි. එසේ වන නමුත් රස දැනවීම මුඛ්‍ය අරමුණ කොටගත් සාහිත්‍ය නිර්මාණයකින් ඒ හා සමගම වෙනත් ප්‍රයෝජන ද සමාජයට අත් කර දෙනු ඇත. "සාහිත්‍යය යනු සමාජය පිළිබිඹු කරන කැඩපතකි" යන ප්‍රකට කියමන මගින් උක්ත අරුතට තවත් පුළුල් අරුතක් එක් කර ලයි. සාහිත්‍යය මගින් ලේඛකයකු හෝ ලේඛිකාවක් සිදු කරනුයේ සමාජය පිළිබිඹු කිරීමකි. වෙනත් අයුරකින් ගතහොත් සමාජයේ සිදු වන දේ පවතින දේ දකින, නිරීක්ෂණය කරන ලේඛකයා එමගින් තමන් ලබන පෞද්ගලික අත්දැකීම් තම නිර්මාණ තුළින් පොදු අත්දැකීම් බවට පත් කරයි. එහිදී සිදුවන්නේ ඉහත දැක්වූ දෙවන පරමාර්ථය ඉටු වීමකි. එනම් සාහිත්‍යය මගින් සමාජය පිළිබිඹු වීමකි. මේ සමගම, සාහිත්‍ය කරණයේ නියැලෙන ලේඛක ලේඛිකාවෝ සමාජය තුළින් උකහාගන්නා අත්දැකීම් ආශ්‍රය කරගනිමින් සිය නිර්මාණ මගින් පාඨකයාට කිසියම් පණිවුඩයක් ද දෙයි. එය සිදු වන්නේ කෙළින් නොව වක් මගිනි. සාහිත්‍ය කෘතියක් කියවන රසිකයා මේ දැක්වූ තෙවැදෑරුම් කරුණු අතින් විපුල ප්‍රයෝජන අත් කරගන්නා බව කිව හැකිය.

සමන්තා විජේසිංහ මහත්මිය, තමන් අතින් රචනා වී ඇති 'සජ්ඣායනා' නවකතාවෙන් ඉහත කී තුන් ආකාරයේ ප්‍රයෝජන පාඨක සමාජයට අත් කර දීමට සමත් වී ඇති බව මෙය කියවන විට පැහැදිලි වෙයි. වෘත්තියෙන් චිත්‍ර ශිල්පිනියක් වන විජේසිංහ මහත්මිය සිය සිතුවම් මගින් ද උක්ත සමාජ පිළිබිඹුව සිදු කරන්නට යොමු වී ඇති අතර ඇයගේ එම නිර්මාණයන්හි මතු වී පෙනෙන කලාත්මක බව සමග විවිධත්වය ද අගය කළ හැකිය. "ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත" යනුවෙන් එදා සමාජය තුළ පුද්ගලයකුගේ හැකියාව එක් අංශයකට සීමා කරන්නට යොමු වූ නමුදු වර්තමානය දෙස බලන විට බොහෝ නිර්මාණ කරුවන් විවිධ අංශවලින් තම කුසලතාව මතු කර දැක්වීමට යොමු වී ඇති බව දැකගත හැකිය. එලෙසින් බලන විට සමන්තා විජේසිංහ මහත්මිය ද මෙවර සිය නිර්මාණ කාර්යයේ නව පියවරක් තබමින් රසවත් මෙන්ම අර්ථයත් වූ ද නවකතාවක් රචනා කරමින් ලේඛිකාවක ලෙස පළමු පිය සටහන තබා ඇත.

'සජ්ඣායනා' ප්‍රමාණයෙන් දීර්ඝ නවකතාවකි. පිටු තුන්සිය පනස් දෙකක් දක්වා දිවෙන මෙහි, සිද්ධි සමූහයක් ද චරිත හැටකට අධික සංඛ්‍යාවක් ද වෙයි. සාහිත්‍ය නිර්මාණයක, විශේෂයෙන්ම නවකතාවක හෝ කෙටිකතාවක දිග ප්‍රමාණය පිළිබඳව නිශ්චිත තීරණයක් නොමැත. ප්‍රධාන චරිත එකක් හෝ දෙකක් ඇතුළත් විය හැකි, කිසියම් එක් ප්‍රධාන සිද්ධියක් හෝ සිතුවිලි මාත්‍රයක් විෂය කොටගෙන ඇති කෙටි නිර්මාණයක් සාමාන්‍යයෙන් කෙටිකතාවක් ලෙස හඳුනාගැනෙයි.

කෙටිකතාව යනු ජීවිතයෙන් පෙත්තක් විදහා දක්වන, එනම් ගලා යන ජීවිතයේ එක් මොහොතක් විනිවිද දැක්වෙන කෙටි රචනාවකි. එවැන්නක දිග ප්‍රමාණය පිටු ගණනින් සීමා කොට දැක්විය නොහැකි වුවත් කෙටි බව එහි විශේෂ ලක්ෂණයකි. එසේ වුවද සිංහල කෙටිකතා අතර මෙන්ම රුසියානු වැනි විශ්ව කෙටිකතා අතර ද දිග ප්‍රමාණයෙන් වැඩි, එහෙත් අතිශය සාර්ථක කෘති ලියවී ඇත. අනික් අතට නවකතාවක් යන්න පැහැදිලිවම දීර්ඝ වූ කෘතියක් ලෙස හැඳින්විය හැකිය. මෙහිලා ද, රුසියානු සාහිත්‍යයම නිදසුන් ලෙස ගත හොත් 'යුද්ධය හා සාමය', 'අපරාධය හා දඬුවම' මෙන්ම 'ඇනා කැරනිනා' ද ප්‍රමාණයෙන් දීර්ඝ කෘති වෙයි. එබැවින් කෙටිකතාවක සීමිත දිග ප්‍රමාණයත්, නවකතාවක පිටු සංඛ්‍යාවත් පිළිබඳව නිශ්චය වශයෙන් සීමා පැනවිය නොහැකිය.

සමන්තා විජේසිංහ තම නවකතාව මගින් සමකාලීන සමාජය විනිවිද දකිමින් ඒ පිළිබඳ විවරණයක් කිරීමට යොමු වීමේදී විශාල සංඛ්‍යාවක් වන චරිත සමූහය ද, සිද්ධිදාමය මෙන්ම එහි ප්‍රතිඵල වශයෙන් ලියවෙන පිටු සංඛ්‍යාව ද පිළිබඳව සීමා මායිම් පනවාගෙන නොමැත. මෙම නවකතාවට විෂය කොටගෙන ඇති චරිත සමූහයෙන් වඩාත් ඉස්මතු වී පෙනෙන චරිත කිහිපයකි. නවකතාව පුරාම විවිධ බාධක, හැලහැප්පීම් මෙන්ම යහපත් හා අයහපත් දිවි පැවතුම් ද එහි සුබ අසුබ ප්‍රතිඵල ද නිරූපණය වෙමින් ඉදිරියට විකාශනය වන චරිත අතර මේඝ, පවනි, මාලන්, අකිල, ගයනි, සිතුමි, ආලෝකා, ඊශ්වර, ලෝචනා, චාමර ආදී ප්‍රබල චරිත රැසක් ප්‍රාණවත් ලෙස නිරූපණය කරන්නට කතුවරිය ගෙන ඇති උත්සාහය බොහෝ දුරට සාර්ථක වී ඇත. මෙවන් චරිත සමූහයක එකතුවෙන් ගෙතී යන විසිතුරු ගෙත්තමක් බඳු 'සජ්ඣායනා' නවකතාව කතුවරිය හා පුරා කියා ලේඛන ජීවිතයට පය ගැසූ අවස්ථාව වුවද පාඨකයනට මෙම කෘතිය අලුත්ම අත්දැකීමක් වනු ඇත.

චිත්‍ර ශිල්පිනියක වශයෙන් සමන්තා දක්වන ප්‍රතිභාව මඳ වශයෙන් සිය නවකතාවට ද මුසු කරගන්නට ඇය ගෙන ඇති පියවර ද මෙම කෘතියේ විශේෂත්වයකි. කතාව කියවාගෙන යන පාඨකයාට අතරින් පතර එහි අන්තර්ගත චරිත හා ඒවා මුහුණ දෙන සෝබර අවස්ථා චිත්‍ර මගින් වඩාත් තම සිත් තුළ ධාරණය කරගන්නට සමත් වන පරිදි මෙම සිතුවම් ජීවමාන ගුණයකින් යුතුව ඉදිරිපත් කර ඇත. සාමාන්‍ය නවකතාවක බොහෝ විට දක්නට නොලැබෙන මෙම විශේෂ ලක්ෂණය 'සජ්ඣායනා' නවකතාව කියවන පාඨකයා සතුටින් පිළිගනු ලැබෙතැයි සිතිය හැකිය.



සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

නවකතාවට වස්තු වී ඇති තේමාව ඉහත කී පරිදි වර්තමාන සමාජයට බෙහෙවින් අදාළ වන, එපමණක් නොව වර්තමාන තරුණ පෙළ බොහෝ දුරට යොමු වී සිටින අන්දමේ ගැටලු සහගත ජීවන පුවත් පාදක කොටගත්තකි. මෙහිදී සිහියට නැගෙන කරුණක් නම් කතුවරිය සිය නවකතාව ආරම්භයේදී යොදාගෙන ඇති ආයාචනාත්මක පාඨයයි. සාහිත්‍ය කරුවකුගෙන් අපේක්ෂිත එක් පරමාර්ථයක් නම්, සමාජය කෙරෙහි, එහි ජීවත් වන්නවුන් කෙරෙහි දයාවක්, අනුකම්පාවක් සිත්හි තබාගෙන රචනා කිරීමයි. ලේඛකයකුට සමාජය තුළ ජීවත් වන අයහපත් චරිතයක් වුව සදය අනුකම්පාවෙන් යුතුව නිරූපණය කළ හැකි නම් එය විශේෂ කුසලතාවකි. සාහිත්‍යය වූ කලී අප සිත් තුළ මානව දයාව කුළු ගන්වන්නකි. එබැවින් ලේඛකයෙක් හෝ ලේඛිකාවක් තම නිර්මාණය තුළින්, සමාජයේ ජීවත් වන්නන්ගේ අයහපත් චරිත ලක්ෂණ පවා සානුකම්පිත ලෙස නිරූපණය කළ යුතු වෙයි.

'සජ්ඣායනා' නවකතාව ආරම්භයේ යෙදෙන, 'දයාබර හිරිමල් යෞවනය' අමතා, 'දයාබර මුහුකුරා ගිය යෞවනය' ගෙන එන පණිවුඩය එක් අතකින් කතුවරියගේ මුඛ්‍ය පරමාර්ථය ඉඟියෙන් දක්වන්නකි. අනික් අතට කතුවරිය තුළ වූ දයාව ද එහි ඉස්මතු වී පෙනෙයි.

"නිවි නිවී දිලෙන පහන් එළි දැල්වුණ අඳුරු රාත්‍රියක, සොඳුරු ලොවක් දැක, සා පිපාසෙන් දිය සොයන මුව පොව්වකු සේ නෙත් පියාගෙන, ඒ දෙසට දිව ගියෙමි ----- "

සජ්ඣායනා, 7 පිට

ජීවිතයේ ඉදිරියට තැබූ පියවර අතරින් සාවද්‍ය තීරණවලට එළඹෙමින් ගිය ගමනේදී මංමුළා වූවකු, තමන් ගිය මග වැරදි බව අවබෝධ වූ විට, ඒ මග නොයන ලෙස මතු පරම්පරාවේ 'හිරිමල්




යෞවනයට' දෙන ඔවදනක් ලෙස මෙම පණිවුඩය සැලකිය හැකිය. සාමාන්‍යයෙන් නවකතාවකදී අපේක්ෂා නොකෙරෙන්නක් වුවද කතුවරිය සිය කෘතිය ආරම්භයේදීම දෙන මෙම පණිවුඩය පාඨකයාට නවකතාව කියවීමේදී යම් පහසුවක් දැනවිය හැකිය. 'මුහුකුරා ගිය යෞවනය' නියෝජනය කරන තරුණ පරපුර සංකේතවත් කරන මෙහි අන්තර්ගත චරිත මගින් කතුවරිය පාඨකයාට, විශේෂයෙන්ම ජීවිතයේ සොඳුරු යොවුන් වියට පා තබා ඇති අයට වැදගත් පණිවුඩයක් දීමට දරා ඇති උත්සාහය නවකතාව පුරාම දැකගත හැකිය.

මෙම කෘතියෙහි අන්තර්ගත පිටු තුන්සිය පනස් දෙක පුරාම, එනම් ආරම්භයේ සිට අවසානය දක්වාම කුතුහලයෙන් යුතුව කතාව කියවාගෙන යාමට පාඨකයා යොමු කරවන බව කිව හැකිය. කතුවරිය යොදා ගන්නා චරිත විකාශනයේදී ඒවා පියවරෙන් පියවරට වර්ධනය වන ආකාරය මගින් මෙම කුතුහලය රඳවාගැනීමට සමත් වී ඇත.

විහාරගෙටම අල්ලා තනා තිබූ ඉපැරණි ගොඩනැගිල්ලක් දුටු ගයනි ඒ දෙසට ගියාය. එහි කුලුනකට හේත්තු වී ජංගම දුරකථනය දෙස නෙත් යොමා සිටි තරුණයෙකුත් ඔහුගේ අතේ එල්ලී ඔහුගේ කනට යමක් කොඳුරන තරුණියකුත් ඇයට දකින්නට ලැබුණි. තරුණිය යමක් පවසා මඳක් ඉවතට ගිය අතර තරුණයා හිස හරවා ගයනි සිටි දිශාව බැලුවේය. ගයනිගේ අත තිබූ නෙළුම් මල ගිලිහී ගිය අතර තරුණයා ඇයට මුහුණ දිය නොහැකිව බිම බලාගත්වනම සිටියේය. ඒ සමගම ආපසු තරුණිය ඈතින් සිටගෙන සිටි ගයනි දුටුවාය. පුදුම වී ඇය දෙස බලා සිටි තරුණිය -------- 257 පිට

අනපේක්ෂිත අවස්ථාවකදී ගයනි නමැති චරිතය දුටු දර්ශනය ඇයගේ මවිතයට හේතු වූ ආකාරය පවසමින් ඉදිරි සිදුවීම් ඒ හා සමග ගළපාගන්නට කතුවරිය තැත් කරන මෙම අවස්ථාවේදී පාඨක